දිවුලපිටිය දිසා රෝහලේදී හිරු ටීවී මාධ්‍යවේදීන් සහ රෝහල් කාර්ය මණ්ඩලය අතර ඇතිවූ සිදුවීමක්, හිරු 6.55 ප්‍රධාන පුවත් විකාශය (10/18) ඔස්සේ දැක්වී තිබිණි. හිරු පුවත් විකාශය ඔස්සේ දැක්වී තිබුණේ දිවුලපිටිය දිසා රෝහලෙන් කොවිඩ්-19 ආසාදිතයෙකු වාර්තා වූ බවට ලැබුණු තොරතුරකට අනුව එම රෝහලේ ඉදිරිපිට දර්ශන ලබාගනිමින් සිටි ප්‍රාදේශීය මාධ්‍යවේදියා රෝහල් බලධාරීන් විසින් රෝහල් පරිශ්‍රය තුළට කැඳවනු ලැබූ බවත්, එහිදී මෙම සිදුවීම වූ බවත් වේ. මෙහිදී රෝහල් බලධාරීන් විසින් පෙන්වා දෙනු ලබන්නේ, අදාළ දර්ශන ගැනීමට පෙර අදාළ රෝහල් බලධාරීන්ගෙන් අවසර ලබාගත යුතු බවයි. හිරු ප්‍රාදේශීය මාධ්‍යවේදියා විසින් පවසන්නේ, ඔවුන් රෝහල ඉදිරිපිට නාමපුවරුව වීඩියෝගත කළ බවයි. වීඩියෝගත වෙමින් තිබූ මෙම රෝහල් පරිශ්‍රය තුළ වූ සිදුවීම හිරු පුවත් විකාශය ඔස්සේ විකාශය කෙරිණි. මෙම සිදුවීම සහ හිරු පුවත් ඔස්සේ එය ඉදිරිපත් වීමද සමාජ මාධ්‍ය ජාල තුළ සැලකිය යුතු ලෙසින් අවධානය දිනාගෙන තිබුණි.

මෙහිදී පෙන්වා දිය යුත්තේ, පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය සහ පුද්ගල ගරුත්වය ආරක්ෂා කිරීම, වෘත්තිය මාධ්‍යකරණයේදී පිළිපැදිය යුතු ආචාර ධර්මයන් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා බවයි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, මහජනතාවට විවෘත නොවන රෝහලක්, සෞඛ්‍ය මධ්‍යස්ථානයක් හෝ පාසැලක් වැනි ස්ථානයක ගොඩනැගිල්ලක් තුළ හෝ පරිශ්‍රය තුළ ඡායාරූප/වීඩියෝ ලබාගන්නේ නම්, ඒ සඳහා එහි අදාළ බලධාරීන්ගෙන් අවසර (ලිඛිත අවසර) ලබාගත යුතු බව මේ සම්බන්ධයෙන් ඇති මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ.

මෙසේ බලන විට, හිරු ප්‍රාදේශීය වාර්තාකරු විසින් රෝහල් බලධාරීන්ගෙන් නිසි අවසරයක් ලබාගැනීමකින් තොරව වීඩියෝගත කිරීම් ඇරඹීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද? එසේ නම් අවශ්‍ය වාර්තා කිරීම් කටයුතු සඳහා අදාළ බලධාරීන්ගේ අවසර මුලින් ලබාගත යුතුව තිබුණා නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

මූලාශ්‍ර:
[https://www.unicef.org/.../afg-publication_UN%20Ethical...](https://www.unicef.org/.../afg-publication_UN%20Ethical...)

[https://www.editorscode.org.uk/the_code.php](https://www.editorscode.org.uk/the_code.php)

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TV #NewsPapers #Coronavirus #HiruTV**